# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
# ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 නොවැම්බර් මස 29 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2019.11.29 දින නිකුත් කරන ලදී)**

## විසර්ජන (සංශෝධන)

**2019 අංක 6 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් 2019 අංක 6 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, රුපියල් දෙදහස් හැත්තෑනව බිලියනයක ණය ගැනුම් සීමාව රුපියල් දෙදහස් දෙසිය හැත්තෑනව බිලියනය දක්වා ඉහළ දැමීම වේ.

# විසර්ජන (සංශෝධන)

එල්.ඩී.—ඕ. 58/2019

## 2019 අංක 6 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2019 අංක      දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

**2.** 2019 අංක 6 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "රුපියල් දෙදහස් හැත්තෑනව බිලියනයක්" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් දෙසිය හැත්තෑනව බිලියනයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*2019 අංක 6 දරන විසර්ජන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*